# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 13 දරන පලාත් පාලන ආයතන (වානිජ හා කාර්මික ව්‍යවසාය) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 මාර්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 මාර්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි | තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 13 දරන පළාත් පාලන ආයතන (වානිජ හා කාර්මික ව්‍යවසාය) පනත

[සහතිකය සටහන් කළේ 1983 මාර්තු මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 16/80

**පළාත් පාලන ආයතන වානිජ හා කාර්මික ව්‍යවසායවල නියුක්තවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

**1.** මේ පනත 1983 අංක 13 දරන පළාත් පාලන ආයතන (වානිජ හා කාර්මික ව්‍යවසාය) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** මහා නගර සභා ආඥාපනතේ 40 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ද) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 252 වන අධිකාරයේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(දද) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය සහිතව—

(i) මහා නගර සභා ආඥාපනත හා නගර සභා ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් මහා නගර සභාවක් හෝ නගර සභාවක් මගින් පිහිටුවා නඩත්තු කරනු ලැබිය හැකි, අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා හෝ මහජන උපයෝගිතා සේවා සඳහා අවශ්‍ය විය හැකි යන්ත්‍ර, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය හා බඩු සෑදීම හා නිෂ්පාදනය කිරීම සඳහා වානිජ හා කාර්මික ව්‍යවසායවල නියුක්ත වීමට ; හා

(ii) ඒ යන්ත්‍ර, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය හෝ බඩු වෙනත් යම් මහා නගර සභාවකට හෝ නගර සභාවකට හෝ මහජනයාට හෝ සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි හා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි මිලට විකිණීමට.".

**3.** මහා නගර සභා ආඥාපනතේ 40 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ආඥාපනතේ 40අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :— 252 වන අධිකාරයේ 40අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"වානිජ හා කාර්මික ව්‍යවසාය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.

40අ. (1) අමාත්‍යවරයා විසින් 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (දද) ඡේදය යටතේ යම් වානිජ හෝ කාර්මික ව්‍යවසායක්—

(අ) ඒ ව්‍යවසායයේ ආර්ථික ජීව්‍යතාවය ;

(ආ) ඒ ව්‍යවසාය ක්‍රියාත්මක වීමෙන් යම් මහා නගර සභාවකට හා මහජනයාට අත්විය හැකි ප්‍රතිලාභ;

(ඇ) ඒ ව්‍යවසායයේ නියුක්ත මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය

සලකා බැලීමෙන් පසු අනුමත කරනු ලැබිය හැකි ය.

(2) 185 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පාර්ලිමේන්තුව විසින් මහා නගර සභාවකට වෙන් කරන ලද කිසිම මුදල් ප්‍රමා

ඊ—68161—12,850 (83/02)

ණයක් හා 185 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් මහා නගර සභාවකට වෙන් කරන ලද කිසිම ප්‍රදානයක් යම් වාණිජ හෝ කාර්මික ව්‍යවසායක් පිහිටුවීමේ හෝ නඩත්තු කිරීමේ කාර්ය සඳහා ඒ සභාව විසින් ප්‍රයෝජනයට නොගත යුතු ය.

(3) නොමනා ලෙස පාලනය කිරීමේ හේතුවෙන් යම් මහා නගර සභාවක යම් වාණිජ හෝ කාර්මික ව්‍යවසායක් නොකඩවා ක්‍රියාත්මක කිරීම, ඒ සභාවේ යහපතට හානිකර විය හැකි බව හෝ සභාවට මූල්‍ය පාඩුවක් වීමට ඉඩ ඇති බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් සභාවේ අදහස් විමසීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් ඒ ව්‍යවසාය ක්‍රියාත්මක කිරීම අවසන් කොට ව්‍යවසායේ සියලු පොත්, ලේඛන හා වත්කම් තම භාරයට ගෙන ඒ නියමය බලාත්මක කිරීමට අවශ්‍ය විය හැකි පියවර ගැනීමට සභාවට විධාන කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් කලින් කල යම් වාණිජ හෝ කාර්මික ව්‍යවසායක නියුක්ත වී සිටින යම් මහා නගර සභාවකට එහි ව්‍යාපාරය පවත්වා ගෙන යාම හෝ ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් කලින් කල ඔහු විසින් නියම කරනු ලබන ආකෘති පත්‍රයක, ව්‍යවසායේ ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු සැපයීමට සභාවට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, සභාව විසින් ඒ සෑම විධානයක් ම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. ".

255 වන අධිකාරියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. නගර සභා ආඥාපනතේ 36 වන වගන්තියේ (එ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (එඑ) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය සහිතව—

(i) පිළිවෙළින් මහා නගර සභා ආඥාපනත හා නගර සභා ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් මහා නගර සභාවක් හෝ නගර සභාවක් මගින් පිහිටුවා නඩත්තු කරනු ලැබිය හැකි, අවස්ථෝචිත පරිදි, රාජ්‍ය සේවා හෝ මහජන උපයෝගිතා සේවා සඳහා අවශ්‍ය විය හැකි යන්ත්‍ර, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය හා බඩු සෑදීම හා නිෂ්පාදනය කිරීම සඳහා වාණිජ හා කාර්මික ව්‍යවසායවල නියුක්ත වීමට; හා

(ii) ඒ යන්ත්‍ර, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය හෝ බඩු වෙනත් යම් නගර සභාවකට හෝ මහා නගර සභාවකට හෝ මහජනයාට හෝ සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි හා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි මිළට විකිණීමට.".

5. නගර සභා ආඥාපනතේ 36 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ආඥාපනතේ 36අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— 255 වන අධිකාරයේ 36අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"වානිජ හා කාර්මික ව්‍යවසාය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.

36අ. (1) අමාත්‍යවරයා විසින් 36 වන වගන්තියේ (එච්) ඡේදය යටතේ යම් වානිජ හෝ කාර්මික ව්‍යවසායක්—

(අ) ඒ ව්‍යවසායේ ආර්ථික ජීව්‍යතාවය ;

(ආ) ඒ ව්‍යවසාය ක්‍රියාත්මක වීමෙන් යම් නගර සභාවකට හා මහජනයාට අත්විය හැකි ප්‍රතිලාභ ;

(ඇ) ඒ ව්‍යවසායේ නියුක්ත නගර සභාවේ මූල්‍ය තත්ත්වය

සලකා බැලීමෙන් පසු අනුමත කරනු ලැබිය හැකිය.

(2) 158 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඌ) ඡේදය යටතේ පාර්ලිමේන්තුව විසින් නගර සභාවකට වෙන් කරන ලද කිසිම මුදල් ප්‍රමාණයක් හා 158 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් නගර සභාවකට වෙන් කරන ලද කිසිම ප්‍රදානයක් යම් වානිජ හෝ කාර්මික ව්‍යවසායක් පිහිටුවීමේ හෝ නඩත්තු කිරීමේ කාර්ය සඳහා ඒ සභාව විසින් ප්‍රයෝජනයට නොගත යුතු ය.

(3) නොමනා ලෙස පාලනය කිරීමේ හේතුවෙන් යම් නගර සභාවක යම් වානිජ හෝ කාර්මික ව්‍යවසායක් නොකඩවා ක්‍රියාත්මක කිරීම, ඒ සභාවේ යහපතට හානිකර විය හැකි බව හෝ සභාවට මූල්‍ය පාඩුවක් වීමට ඉඩ ඇති බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් සභාවේ අදහස් විමසීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් ඒ ව්‍යවසාය ක්‍රියාත්මක කිරීම අවසන් කොට ව්‍යවසායේ සියලු පොත්, ලේඛන හා වත්කම් තම භාරයට ගෙන ඒ නියමය බලාත්මක කිරීමට අවශ්‍ය විය හැකි පියවර ගැනීමට සභාවට විධාන කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් කලින් කල යම් වානිජ හෝ කාර්මික ව්‍යවසායක නියුක්ත වී සිටින යම් නගර සභාවකට එඩි

ව්‍යාපාරය පවත්වා ගෙන යාම හෝ ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් කලින් කල ඔහු විසින් නියම කරනු ලබන ආකෘති පත්‍රයක, ව්‍යවසායේ ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු සැපයීමට සභාවට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, සභාව විසින් ඒ සෑම විධානයක්ම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. ".